දිනය: 2021-10-05
අංකය: 20

# මාධ්‍ය නිවේදනයයි
# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

## ගමන් බලපත්‍ර ලබාගැනීමට පැමිණෙන සියලු අයදුම්කරුවන් වෙබ් අඩවිය ඔස්සේ දිනයක් හා වේලාවක් වෙන් කර ගැනීම

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලය මෙන්ම මාතර, වවුනියාව, මහනුවර, කුරුණෑගල යන ප්‍රාදේශීය කාර්යාලවල සියලු සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සීමිත සේවාලාභීන් පිරිසක් සඳහා විදේශ ගමන් බලපත්‍ර ලබා දීම සිදු කරයි.

ඒ අනුව අත්‍යවශ්‍ය සේවා අවශ්‍යතා ඇති සේවාලාභීන් පමණක් තම පදිංචි ස්ථානයට ආසන්නතම කාර්යාලයට පැමිණෙන ලෙසත්, පහත දක්වා ඇති **වෙබ් දිගුව භාවිතා කොට දිනයක් වෙන් කර ගැනීමෙන් අනතුරුව පැමිණිය යුතු බවත්** දන්වා සිටිමි. එලෙස දින වෙන් කර ගැනීමකින් තොරව පැමිණෙන පුද්ගලයින් සඳහා කාර්යාල පරිශ්‍රයට ඇතුළු වීමට අවසර ලබා නොදෙනු ඇත.

**දින වෙන් කිරීම** සඳහා පහත වෙබ් දිගුව වෙත පිවිසෙන්න -
https://eservices.immigration.gov.lk/td

**බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලය මගින් එක්දින හා සාමාන්‍ය සේවා ගමන් බලපත්‍ර ලබාගැනීමට අදාල තොරතුරු විමසීම් සඳහා;**

| සේවාව | විවෘතව තබන වේලාව | වැඩිදුර තොරතුරු විමසීම් |
|---|---|---|
| ගමන් බලපත්‍ර ලබාගැනීම සඳහා අයදුම්පත් භාර දීම. | පෙ.ව. 8.30 සිට ප.ව. 1.00 | 0707101060, 0707101070 |

**ප්‍රාදේශීය කාර්යාල මගින් සාමාන්‍ය සේවා ගමන් බලපත්‍ර ලබාගැනීමට අදාල තොරතුරු විමසීම් සඳහා;**

| **ප්‍රාදේශීය කාර්යාලය** | විවෘතව තබන වේලාව | වැඩිදුර තොරතුරු විමසීම් |
|---|---|---|
| මාතර ප්‍රාදේශීය කාර්යාලය | පෙ.ව. 8.30 සිට ප.ව. 1.00 | 041-5412212, 041-5104444 |
| මහනුවර ප්‍රාදේශීය කාර්යාලය | | 081-5624509, 081-5624470 |
| වවුනියාව ප්‍රාදේශීය කාර්යාලය | | 025-5676344, 025-5676345 |
| කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය | | 037-5550562, 037-5550563 |

**වැදගත්:** ඉහත සඳහන් සියළු සේවාවන් ලබාදීම පවතින වසංගත තත්වය හමුවේ **රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ, ඇඳිරි නීතිය පැනවීම්, සෞඛ්‍ය අංශ හා ආරක්ෂක අංශ තීරණයන්ට** යටත් වන බවද, ඒ අනුව සේවාව ලබාදීම පිළිබඳ තීරණ වරින්වර සංශෝධනය කිරීම් වලට යටත්වන බවද නිවේදනය කරමි.

පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව